පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 79

மாவட்ட செயலகம், கேகாலை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் படிமுறைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No –79

District Secretariat Kegalle

Submission of observations of the Hon Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119 (4)

පාර්ලිමේන්තු මාලා අංක - 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කරගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ස්ථාවර වත්කම් ලෙඛනයක් පවතින අතර එහි යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලටද ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යන ලෙස දැනුම් දී ඇත.
අනවසර අල්ලාගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අනවසර අල්ලාගැනීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන ලදී.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	වර්තමානයේදී නිවැරදි කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	වර්තමානයේදී නිවැරදි කර ඇත.
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කමිටු අවම ප්‍රමාණයෙන් හෝ රැස්ව නැත.	2024 වර්ෂයේදී, පළමු හා දෙවන කාර්තු තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කමිටු පවත්වා ඇත.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	නිල වාහන හැර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචිත වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර ඇත.
මු.රේ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී දින 14 ක් ඇතුළත නිරවුල් කිරීම ප්‍රමාණවත් බව දැනුවත් වී තිබූ බැවින් දින 10 ක් ඇතුළත අග්‍රිම නිරවුල් නොකරන ලද අවස්ථා පැවති නමුත් මේ වනවිට ඉදාළ කාර්ය නිමවූ දිනට පසුදිනම අග්‍රිම නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.
අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් හැර අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	දිස්ත්‍රික් ලේකම් වෙත නිලධාරීන් බඳවා ගැනීමට බලය පැවරී නොමැති අතර සංවර්ධන නිලධාරීන් බඳවා

	ගැනීමේ බලධාරියා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වේ. අතිරික්ත සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශය දැනුවත් කර ඇත.
මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම් සභාපතිවරුන් සමඟ සාකච්ඡා කර, 2024 වර්ෂය සඳහා මාසිකව කමිටු රැස්වන දිනයන් පිළිබඳ සැලසුම් සකස් කර තිබේ. ඒ අනුව, 2024 වර්ෂයේ ජනවාරි 05, පෙබරවාරි 14, මාර්තු 13, මැයි 02 හා ජූනි 20 වශයෙන් ජූලි මාසය අවසන් වනවිට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් 05 ක් පවත්වා ඇත.
දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට මාසිකව ප්‍රාදේශීය ලේකම් සමුළුව පැවැත්වීමට නටයුතු සිදු කර ඇත.
දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබුණි.	දිස්ත්‍රික් නිවාස කමිටුව යටතේ සාකච්ඡා කිරීමට විශේෂ කරුණු නොමැති බැවින් මාසිකව රැස්වීම් පැවැත්වීම අවශ්‍ය නොවන බව නිවාස සංවර්ධන අධිකාරිය විසින් දැන්වූ බැවින් මාසිකව දිස්ත්‍රික් නිවාස කමිටුව නොපැවැත්වූ අතර ප්‍රගති සමාලෝචනය සඳහා මාස 03 කට වරක් රැස්වීම් පවත්වනු ලැබීය.
දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු මාසිකව රැස් වී නොතිබුණි.	ඉදිකිරීම් සම්බන්ධ ද්‍රව්‍යයන්වල මිල ගණන් උච්චාවචනය ඒකාකාරීව සිදුවන බැවින් ද, මිල කමිටු පැවැත්වීමට අදාළ ප්‍රතිපාදන නොමැති බැවින් ද මිල කමිටුව මාසිකව පැවැත්වීමට නොහැකි වී ඇති අතර එය කාර්තුවකට වරක් පවත්වනු ලැබේ.
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සමාන ආකෘතියක් සහිත වෙබ් අඩවි හඳුන්වා දී එය යාවත්කාලීන කිරීමට තොරතුරු තාක්ෂණ නිලධාරී / සහකාර වෙත පවරා දී ඇත. ඒ අනුව මහජනයාට ආයතනය පිළිබඳව තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් 2022 වර්ෂය වන විට පැවතිනි. එය නිර්මාණය කර ඇත්තේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් නොවන අතර රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා

	පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිර්මාණය කර ලබා දී ඇති එම වෙබ් අඩවිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් යාවත්කාලීන කිරීමේ කටයුතු පමණක් අබණ්ඩව මේ දක්වා සිදු කරමින් පවතී. කාර්යාලයීය විවිධ අංශ සතු විවිධ තොරතුරු තොරතුරු තාක්ෂණ ඒකකය වෙත ලබා දෙන ලෙස දන්වා ඇති අතර එම තොරතුරු ලබා දුන් පසු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතී. අදාළ තොරතුරු නොලැබෙන අවස්ථාවලදී වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට නොහැකි තත්වයක් පවතින අතර තොරතුරු ලැබෙන අවස්ථාවල යාවත්කාලීන කටයුතු සාර්ථකව සිදු වෙමින් පවතී.
2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙබ් අඩවියේ පළ කර ඇති අතර, ඩිජිටල් තිරයක එම ප්‍රඥප්තිය කාර්යාලයේද ප්‍රදර්ශනය කර ඇත.
ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධික්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයන් සකස්කර නොතිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සෘජුවම මහජනයා සම්බන්ධ අවස්ථා අවම වන අතර එසේ මහජනයා පැමිණෙන ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය අංශයේ රාජකාරී කටයුතු සම්බන්ධයෙන් පුරවැසි සේවා ප්‍රඥප්තිය එම අංශයේ ප්‍රදර්ශනය කර ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීම සිදුවේ.
2018.01.24 දිනැති අංක 02/2018(1) දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.	2023, 2024 වර්ෂ සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් පැය 12 ක අතිරේක පුහුණුවක් නියම කර නොතිබුණි.	2023 රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛ මඟින් පුහුණු වැඩසටහන් පැවැත්වීම තාවකාලිකව නතර කළද නොමිලයේ පැවැත්වූ පුහුණු වැඩසටහන් සීමිත ප්‍රමාණයක් සිදු කිරීම නිසා සෑම නිලධාරියෙකුටම පැය 12ක් ආවරණය කිරීමට නොහැකි විය.

සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම ආරම්භ කර අවසාන අදියරේ ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ /ව්‍යාවචන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ පවතී.
සියලුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂය වනවිට සියලුම නිලධාරීගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.
මු.රේ 119 ප්‍රකාරව අයකළ යුතු අධිභාර අයකර නොතිබුණි.	මු.රේ 119 ප්‍රකාරව අයකළ යුතු අධිභාර කිසිවත් එම වර්ෂයේදී අයකිරීමට නිබි නොමැත.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නියි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු සිදු කර ඇති අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් යටතේ ගලපාගත හැකි ස්ථාන මාරුවීම් සිදු කර ඇත.
දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02 කට වරක් රැස්වී නොතිබුණි.	මාස 02 කට වරක් බැගින් වර්ෂයට පරිසර කමිටු 06 ක් පැවැත්වීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2016.11.17 දිනැති අංක SDW/3/16-2016 චක්‍රලේඛයේ උපදෙස් පරිදි වන අලි හානි හා වෙනත් වන සතුන්ගෙන් සිදුවන හානි පිළිබඳ වන්දි කමිටුව රැස්වී නොතිබුණි.	මෙම දිස්ත්‍රික්කයේ වන අලි හානි සම්බන්ධ සිද්ධි වාර්තා නොවීම හා වෙනත් සතුන්ගෙන් සිදුවන හානි සම්බන්ධයෙන් වන්දි නොගෙවීම මත මෙවැනි කමිටුවක් මෙතෙක් ක්‍රියාත්මක නොවීම.

ජේ. ඒ. ඒ. සී. නිල්මල්ගොඩ
ප්‍රධාන ගණකාධිකාරී
කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ජේ. එම්. ආර්. පී. ජයසිංහ
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර මෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් සෞඛ්‍යමය අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය